2022 ජූලි 25
2022 யூலை 25
25th July 2022

NAOSL

# 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාව

# 2018 இன் 19 ஆம் இலக்க தேசிய கணக்காய்வு அதிகாரச்சட்டத்தின் 14 ஆவது பிரிவின் பிரகாரம் பாராளுமன்றத்திற்கு சமர்ப்பிக்கப்படுகின்ற கணக்காய்வாளர் தலைமை அதிபதியின் மூன்றாண்டு அறிக்கை

# Triennial Report of the Auditor General presented in parliament in terms of Section 14 of the National Audit Act, No. 19 of 2018

**එකලොස් වන කාණ්ඩය - 01**
பதினோராவது தொகுதி - 01
Eleventh Volume - 01

## ස්වාධීන කොමිෂන් සභා
## சுயாதீன ஆணைக்குழுக்கள்
## Independent Commissions

**ජාතික විගණන කාර්යාලය**
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



## පටුන


| ශීර්ෂය<br>-------- | ආයතනය<br>------------ | පිටුව<br>------ |
|---|---|---|
| | පෙරවදන | 1 |
| 6 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය | 2 |
| 7 | අධිකරණ සේවා කොමිෂන් සභාව | 2-4 |
| 8 | ජාතික පොලිස් කොමිෂන් සභාව | 4-5 |
| 9 | පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය | 6 |
| 10 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව | 7-8 |
| 11 | මුදල් කොමිෂන් සභාව | 9 |
| 13 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | 9-13 |
| 20 | මැතිවරණ කොමිෂන් සභාව | 14-16 |
| 25 | සීමා නීර්ණය කොමිෂන් සභාව | 17 |
| 302 | සමුපකාර සේවක කොමිෂන් සභාව | 18-19 |
| 335 | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | 20-21 |

# පෙර වදන

ශ්‍රී ලංකාවේ දැනට පවතින ස්වාධීන කොමිෂන් සභා එකොළහක් පදනම් කරගෙන මෙම වාර්තාව පිළියෙල කර ඇත. වෙන් වෙන් වශයෙන් එම ආයතනවලට අදාලව 2018, 2019 හා 2020 වර්ෂවලට අදාලව හඳුනාගත් වාර්ථාවේ දිනට විසඳී නොමැති වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් කර තිබේ. තවද මෙහි සඳහන් එක් එක් ශීර්ෂයට (කොමිෂන් සභාවට) අදාලව 2018, 2019 හා 2020 වර්ෂවල විසර්ජන පනත්වලින් ලැබුණු මුල් ප්‍රතිපාදනය, වසර අග ශුද්ධ ප්‍රතිපාදනය, ඒ ඒ වසරේ සත්‍ය වියදම හා වසර අග ඉතිරිවීම් පුනරාවර්තන හා මූලධන වියදම් වශයෙන් වෙන වෙනමද, ඒවායේ එකතුවද, ඉහත වර්ෂ වලදී ඒ ඒ ආයතනය වෙනුවෙන් ලබාදී තිබෙන විගණන මතයන්ද මේ සමඟ ඉදිරිපත් කර තිබෙන උපලේඛන 1 හි ඇතුලත් කර තිබේ.

විශේෂයෙන් මෙම කොමිෂන් සභා වෙනුවෙන් වෙන් කර තිබෙන පුනරාවර්තන ප්‍රතිපාදන මූලධන ප්‍රතිපාදනවලට වඩා විශාල අගයක් ගෙන තිබූ බව නිරීක්ෂණය විය. තවද වාර්ෂිකව ඉදිරි වැඩ සැලසුම් සකස් කිරීම ඊට අනුකූලව කටයුතු මෙහෙයවීම හා වසර අවසානයේදී ඊට අදාල ප්‍රගතිය සමාලෝචනය කර වාර්තා ඉදිරිපත් කිරීම අතින් ස්වාධීන කොමිෂන් සභා ඉතාම දුර්වල ටම්ටමක පැවති අතර සමහර කොමිෂන් සභා වල ක්‍රියාකාරකම් විනිවිදභාවයෙන් සිදු කර නොමැති බවත් විගණන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු විශ්ලේෂණය කිරීමට අවශ්‍ය දත්ත රැස්කිරීමට නොහැකි මට්ටමක පවතින බවත් නිරීක්ෂණය විය. තවද තම විෂය පථයට යෝග්‍ය පරිදි පනත් හෝ වෙනත් නෛතික විධිවිධාන සකස් කර ගැනීමට සමහර ආයතන කටයුතු කර නොතිබුණි. ස්වාධීන කොමිෂන් සභා 11 ට අදාලව 2018, 2019 හා 2020 වර්ෂවලදී පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා ශුද්ධ ප්‍රතිපාදනය පිළිවෙලින් රු. 8,117,242,000 ක්, රු. 6,588,236,800 ක් හා රු. 11,765,151,000 ක් වූ අතර එම වර්ෂවල මුළු සත්‍ය වියදම පිළිවෙලින් රු.5,630,125,061 ක්, රු.5,602,215,410 ක් හා රු.9,250,313,521 ක් විය. කලට වේලාවට මුදල් නොලැබීම හෝ ආයතනය කාලීනව කටයුතු නොකිරීම නිසා 2018, 2019 හා 2020 වර්ෂ අගදී මුළු ප්‍රතිපාදන වලින් ඉතිරිවීම් පිළිවෙලින් රු.2,487,116,939 , රු.986,021,390 ක් හා රු.2,514,837,479 ක් වූ අතර එම අගයන් සමස්ථ අයවැය සැලැස්මේ විචලනයන් සඳහා ඒ ඒ වර්ෂවලදී බලපෑම් කර තිබුණි.

ශීර්ෂ 6 - රාජ්‍යසේවා කොමිෂන් සභා කාර්යාලය

ප්‍රමාණාත්මක නිරීක්ෂණ නොමැත.

ශීර්ෂ 7 - අධිකරණ සේවා කොමිෂන් සභාව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | ------------------------ | ------------------------ | ----------------------------- | -------------------- |
| | **2020** | | | |
| 1. | 2020 දෙසැම්බර් 31 දිනට වසර 03 කට වැඩි කාලයක සිට නිලධාරියකුගෙන් අයවිය යුතු රු.185,000 ක ණය ශේෂයක් පැවතුණි. | හිඟ ණය ශේෂය නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | හිඟ ණය ශේෂය චක්‍රලේඛ ප්‍රකාරව අය කර ගැනීමට කටයුතු කරන අතර අනෙකුත් ණය ශේෂ නිසි පරිදි අයකර ගැනීමට කටයුතු කිරීම. | මෙතෙක් හිඟ ණය ශේෂය අයකර ගෙන නොමැත. |
| 2. | රු.2,500,000 ක් වටිනා Jaguar වර්ගයේ මෝටර් රථයක් අවුරුදු 03 ක කාලයක සිට නිශ්ක්‍රීයව තිබුණි. | නිශ්ක්‍රීය වත්කම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අවස්ථා 03 කදී ටෙන්ඩර් කැඳවා විකිණීමට උත්සාහ කළද තක්සේරු මිලට මිල ගණන් ඉදිරිපත් නොවුණි. | අපහරණය හෝ විකිණීම මේ දක්වා අවසන් වී නොමැත. |
| 3. | අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ තනතුරු 16 ක පුරප්පාඩු 77 ක් පැවති අතර තනතුරු 08 ක නිලධාරීන් 24 ක් අතිරික්තව පැවතුණි. | කාර්ය මණ්ඩලය විධිමත් පරිදි පවත්වා ගත යුතු වීම. | අනුමත කරන ලද සේවක සංඛ්‍යාව 117 කි. 2021.12.31 ට තත්‍ය සේවක සංඛ්‍යාව 69 කි. අනුමත සංඛ්‍යාව ඉක්මවා සිටින නිලධාරීන්ගෙන් පුරප්පාඩු ව පවතින තනතුරුවල රාජකාරී කටයුතු පූරණය කරඇත. | කාර්ය මණ්ඩල විධිමත් කර ගැනීමට මෙතෙක් කටයුතු කර නොමැත. |

**2019**

| | | | | |
|---|---|---|---|---|
| 4. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ - 2006 (5.6) ඡේදයේ විධිවිධාන අනුව ලංසු සඳහා ආරාධනා කිරීමේ දී පිළියෙල කරන ලද ලංසු ආරාධනා ලියවිල්ලේ මිල දී ගැනීමට අපේක්ෂිත භාණ්ඩ වල පිරිවිතර නිශ්චිතවම දක්වා නොතිබූ අතර 2019 ජූලි 19 දින ලියාපදිංචි තැපෑලෙන් යවන ලද ලංසු ලේඛන වල මිල දී ගැනීමට අපේක්ෂා කරන වායු සමීකරණවල මාදිලිය නිශ්චිතව දක්වා නොතිබූ අතර 2019 ජූලි 30 දින ෆැක්ස් පණිවුඩයක් මඟින් අවශ්‍ය මාදිලිය ලංසුකරුවන් වෙත දන්වා යවා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ - 2006 (5.6) ඡේදයේ විධිවිධාන අනුව මිල දී ගැනීමට අපේක්ෂිත භාණ්ඩ වල පිරිවිතර නිශ්චිතවම දැක්විය යුතු වේ. | නුසුදුසු භාණ්ඩ මිලදී ගැනීමෙන් රජයට සිදුවිය හැකි පාඩුව වළක්වා ගැනීම සඳහා දෝෂය හඳුනාගත් අවස්ථාවේදී කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන කටයුත්තේදී ප්‍රසම්පාදනය මාර්ගෝපදේශ සංග්‍රහය 2006 (5.6) ඡේදය අනුව කටයුතු කර නොතිබුණි. |
| 5. | ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන අධිකරණ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා නිලධාරීන් 05 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | අවශ්‍යතාවය අනුව තනතුරු අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අනුමත කාර්යය මණ්ඩලයේ සහකාර ලේකම් තනතුරු 04 හි පවතින පුරප්පාඩු මෙම අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ නිලධාරීන්ගෙන් පූරණය කර ගැනීමට කටයුතු කර ඇත. අධිකරණ | මෙතෙක් අදාල තනතුරු අනුමත කර ගැනීමක් සිදු වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | රෙජිස්ට්‍රාර් තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් පවතී. | |

**<u>2018</u>**

| | | | | |
|---|---|---|---|---|
| 6. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 (i) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කොමිෂන් සභාව විසින් විගණන හා කළමණාකරන කමිටුවක් පත්කර නොතිබුණි. | විගණන හා කළමණාකරන කමිටුවක් පත්කර නියමිත කාල වකවානු තුළ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුවේ. | ආයතනය තුළ මූල්‍ය විනය නිසි ලෙස පවත්වා ගෙන යමින් රාජ්‍ය මූල්‍ය හා ගිණුම්කටයුතු මුදල් රෙගුලාසි හා අදාල චක්‍රලේඛ අනුව මනා කළමනාකරණයකින් යුතුව නිසි පරිදි පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. | අභ්‍යන්තර විගණක වරයෙකු පත්කර අදාල කමිටුව පිහිටුවීමට මේ දක්වාම කටයුතු කර නැත. |

ශීර්ෂ 8 - ජාතික පොලිස් කොමිෂන් සභාව

| | **විගණනයේ නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| 1. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වන සංශෝධනයට අනුව 47 ව්‍යවස්ථාවේ 15 ඊ යටතේ කොමිෂන් සභාව විසින්, ජනතා සාමාජිකයන්ගෙන් හෝ යම් අතෘප්තියට පත් තැනැත්තෙකුගෙන් ලැබෙන පැමිණිලි භාර ගැනීම සඳහා සහ විමර්ශනය කිරීම සඳහා | 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල අනුව කාර්ය පටිපාටි ස්ථාපිත කිරීමට රීති සාදනු ලැබිය යුතුය. | පැමිණිලි භාරගැනීම හා විමර්ශණය කිරීම සඳහා වන කාර්ය පරිපාටිය සකස්කිරීමට බලාපොරොත්තු වන අතර ඒ සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවට අදාලව පනත් කෙටුම්පතක් සකස්කර ඇත. | මේ දක්වාම අදාල රීති සකස් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්ය පටිපාටි ස්ථාපිත කිරීමට රීති සාදනු ලැබිය හැකි බවට සඳහන් වූවද 2021මාර්තු 28 දක්වා එම රීති සකස් කර නොතිබුණි. | | | |
| 2. | පොලීසිය විසින් ක්‍රියා නොකිරීම, බලය අයථා ලෙස පරිහරනය හා පක්ෂග්‍රාහී වීම සම්බන්ධ පැමිණිලි ලැබීම පෙර වර්ෂයේදී මෙන්ම 2020 වර්ෂයේදීද ලද පැමිණිලි වලින් සියයට 80 ඉක්මවා තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව ප්‍රමාණාත්මක වැඩි වීමක්ද තිබුණි. බලය අයථා ලෙස පරිහරනය පිළිබඳ පැමිණිලි විසඳීමේ ප්‍රතිශතය ඉකුත් වර්ෂයේදී සියයට 77 ක් වූ නමුත් මෙම වර්ෂයේදී සියයට 68 දක්වා අඩුවී තිබුණි. එමෙන්ම පක්ෂග්‍රාහී වීම පිළිබඳ පැමිණිලි ලැබීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 92 කින් වර්ධනය වී තිබූ නමුත් පැමිණිලි විසඳීම සියයට 83 සිට 74 දක්වා අඩුවී තිබුණි. | කොමිසමට ලැබෙන පැමිණිලි විභාග කිරීමට විධිමත් වැඩ පිළිවෙලක් යෙදිය යුතුය. | නිරීක්ෂණයන් නිවැරදි වුවත් 2021.02.28 දින වනවිට පැමිණිලි විසඳීමේ ප්‍රතිශතයේ සාමාන්‍යය 80% දක්වා වැඩිවී ඇත. මෙම කාණ්ඩය යටතේ යොමු වන පැමිණිලි විමර්ශනය සඳහා විස්තරාත්මක තොරතුරු පැමිණිලිකරුගෙන්ම ලබාගතයුතු අවස්ථා බොහෝවිට ඇත. එවැනි තොරතුරු ලැබීම ප්‍රමාදවීම මත ඊට අදාළ විමර්ශන සඳහා සැලකිය යුතු කාලයක් ගතවේ. එබැවින් එවැනි විමර්ශන කටයුතු ප්‍රමාදවීමක් සිදුවේ. තවද පොලිස් වාර්තා ප්‍රමාදවීම මත ද විමර්ශන කටයුතු නිම කිරීම ප්‍රමාද වී ඇත. | 2018, 2019 හා 2020 වර්ෂවල ලද මහජන පැමිණිලි අතරින් 2021 දෙසැම්බර් 31 දින වන විටත් විමර්ෂනය අවසන් නොවූ මුළු පැමිණිලි සංඛ්‍යාව 476 ක් විය. ඒ අතර පොලීසිය ක්‍රියා නොකරීම සම්බන්ධ පැමිණිලි 192 ක් ද බලය අයථා ලෙස පරිහරණය සම්බන්ධ පැමිණිලි 112 ක් ද පක්ෂග්‍රාහී වීම සම්බන්ධ පැමිණිලි 88 ක් ද විය. |

ශීර්ෂ - 09 - පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | 2018 වර්ෂය ආරම්භයේදී අභියාචනා 958 ක කටයුතු කිරීමට තිබුණු අතර වර්ෂය තුළ අභියාචනා 424 ක් ලැබී තිබුණි. අභියාචනා 17 ක් නැවත කැඳවා තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේදී කටයුතු කළ යුතු මුළු අභියාචනා සංඛ්‍යාව 1399 ක් වී තිබුණි. 2018 වර්ෂයේදී අභියාචනා 520 ක කටයුතු අවසන් කර තිබුණු අතර තවත් අභියාචන 879 ක කටයුතු ඉදිරි වර්ෂයේදී කළ යුතුව තිබුණි. | අභියාචනා අවසන් කිරීමට කටයුතු කළ යුතුය. | නිවැරදි කිරීම සඳහා ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | 2021 වර්ෂය ආරම්භයේදී අභියාචනා 929 ක කටයුතු කිරීමට පැවතුනි. 2021 සැප්තැම්බර් 30 දිනට අභියාචනා 111 ක් ලැබී තිබුණු අතර ඒ අනුව එදිනට කටයුතු කිරීමට පැවති මුළු අභියාචනා සංඛ්‍යාව 1040 ක් විය. 2021 සැප්තැම්බර් 30 දින වන විට ඉන් අවසන් කර තිබුණේ අභියාචනා 42 ක කටයුතු පමණි. |

ශීර්ෂ 10 - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභාව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | 2019 දෙසැම්බර් 31 දිනට රු. 2,597,130 ක වැටලීම් අත්තිකාරම්වලට අදාල නඩු තීන්දු ප්‍රකාශයට පත් කර තිබුණද, 2021 මාර්තු 30 දින වන විටද එම ශේෂ නිරවුල් කර නොතිබුණි. | අල්ලස් වශයෙන් පරිහරණය සඳහා ලබාදෙන අත්තිකාරම්, නඩු භාණ්ඩ නිලධාරියා භාරයේ හෝ එම නඩු අවසන් වී නඩු තීන්දු ප්‍රකාශයට පත් කරන තෙක් රඳවාගෙන, පසුව සරප් වෙත නිරවුල් කළ යුතුය. | අවසන් වූ නඩු වලට අදාල ගොනු ගෙන්වා ගැනීම සඳහා අදාල අංශ හා නීති නිලධාරීන් වෙතින් විමසුම් කර ඇත. | 2021.12.08 දිනට නිරවුල් කළ යුතු වැටලීම් අත්තිකාරම් ශේෂය රු. 2,086,780 ක් විය. |
| 2. | නඩු තීන්දු ලබා දී වර්ෂ ගණනාවක් ගත වුවද ඇතැම් ගොනුවලට අදාල නඩු භාණ්ඩ, නඩු භාණ්ඩ නිලධාරියා භාරයේ පැවතුණි. | අධිකරණමය කටයුතුවලින් පසු නඩු තීන්දුව ලැබීමෙන් අනතුරුව හෝ අභියාචන අවසන් වීමෙන් අනතුරුව එම ගොනුවලට අදාලව නඩු භාණ්ඩ නිලධාරීයාගේ භාණ්ඩ ශේෂය තුළ පවතින භාණ්ඩ පොත්වලින් ඉවත් කළ යුතුය. | අපහරණ කමිටුවක් පත් කිරීමට හා නඩු භාණ්ඩ සමීක්ෂණයේදී ලබා දෙන නිර්දේශ වලට අනුව කටයුතු කිරීමට තීරණය කර ඇත. | මේ දක්වාම නඩු භාණ්ඩ එලෙසම පවතී. |
| 3. | 2016 මාර්තු 01 දින පැවති ආර්ථික කළමණාකරන අමාත්‍ය මණ්ඩල කමිටුව මඟින් අංක 36/69/සී දරන මලලසේකර මාවතේ පිහිටි භූමිය කොමිෂන් සභාව වෙත පවරා දීමට 2016 වර්ෂයේදී තීරණය වී තිබුණද එහි නිත්‍යානුකූල | භූමියේ නිත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් ඉල්ලීමක් සිදු කර ඇත. | තවමත් පවරාගෙන නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අයිතිය තහවුරු කර ගැනීමට 2020 දෙසැම්බර් අවසාන දින වනවිටත් නොහැකි වී තිබුණි. | | | |
| 4. | 2020 දෙසැම්බර් 31 දිනට සිවිල් කාර්යමණ්ඩල පුරප්පාඩු 425 ක් හා විමර්ශන අංශ කාර්යමණ්ඩල පුරප්පාඩු 44 ක් පැවතුණි. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා පුරප්පාඩු, නිසි පරිදි පිරවීමට කටයුතු කළ යුතුය. | 2021 වර්ෂයේ සිවිල් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 24 ක් පුරවා තිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට සිවිල් කාර්යමණ්ඩල පුරප්පාඩු 411 ක් හා විමර්ශන අංශ කාර්යමණ්ඩල පුරප්පාඩු 15 ක් පවතුණි. |

ශීර්ෂ 11 - මුදල් කොමිෂන් සභා කාර්යාලය

| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 2018 වර්ෂයේදී ආරම්භ කර තිබුණු කොමිෂන් සභා පනත සකස් කිරීම සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අවසන් කර නොතිබුණි. | පනත සකස් කිරීමේ කටයුතු සිදු කළ යුතු වීම | යෝජිත පනත සකස් කිරීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව හා මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා පවත්වා ඇත. | පනත සකස් කිරීමේ කටයුතු අවසන් වී නැත. |

ශීර්ෂ 13 - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | 2018 | | | |
| 1. | කොමිෂන් සභාවේ ශාඛා කාර්යාල 04 ක් විසින් 2018 ජනවාරි මාසයේ සිට ජූනි මාසය දක්වා කාලයට අදාළ මාසික වැඩ සැලසුම් වාර්තා (work plan) හා සැලසුම් කළ කාර්යයන් හි ප්‍රගති වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වැඩ සැලැසුම් වාර්තා (work plan) හා සැලැසුම් කළ කාර්යයන්හි ප්‍රගති වාර්තා මාසිකව ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතු විය. | ශාඛා කාර්යාල වෙත මාසිකව වැඩ සැලසුම් සකස් කිරීමට උපදෙස් දී ඇත. | සමහර ප්‍රාදේශීය කාර්යාල විසින් මෙම වාර්තා ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කර නැත. |
| 2. | අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වී තිබුණත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් එම තනතුර පිරවීමට | අභ්‍යන්තර විගණකවරයකු පත්කර ගත යුතු විය. | 2020 වර්ෂයේදී මෙම තනතුර සඳහා අභ්‍යන්තරව අයදුම්පත් කැඳවා තිබුණද අයදුම්කරුවන් | තවමත් මෙම පුරප්පාඩුව පුරවා නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කොමිෂන් සභාවට කටයුතු කර නොතිබුණි. | | සුදුසුකම් සපුරා නොතිබුණි. | |
| | 2019 | | | |
| 3. | 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (8) ඡේදය ප්‍රකාරව නිර්දේශයක් යවනු ලැබූ යම් අධිකාරියක් හෝ තැනැත්තකු හෝ තැනැත්තන් විසින්, ඒ නිර්දේශයේ සඳහන් කාලය ඇතුළත, කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක හෝ ඒ තැනැත්තා විසින් කොමිෂන් සභාව වෙත වාර්තා කර කොමිෂන් සභාවේ නිර්දේශ බලාත්මක කිරීම පිණිස ගෙන ඇති හෝ ගැනීමට අදහස් කර ඇති ක්‍රියාමාර්ග කොමිෂන් සභාවේ මතය අනුව ප්‍රමාණවත් නොවන අවස්ථාවක කොමිෂන් සභාව විසින් ඒ කරුණු පිළිබඳව පරිපූර්ණ වාර්තාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර | පනත ප්‍රකාරව පරිපූර්ණ වාර්තාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුවේ. | අසාධු ලේඛණයක් සකස් කර ජනාධිපතිවරයා වෙත යොමු කිරීමට කොමිෂන් සභා මාණ්ඩලික තීරණයක් ගැනීමට කටයුතු කරමින් පවතී. | කොමිෂන් සභාව විසින් මේ පිළිබඳව පරිපූර්න වාර්තාවක් මෙතෙක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබුණි. | | | |
| 4 | 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 30 ඡේදය ප්‍රකාරව කොමිෂන් සභාවේ සියළු කටයුතු පිළිබඳ තොරතුරුද, කොමිෂන් සභාව වෙත යොමුකරන ලද සියළු කාරණාවල ලැයිස්තුවක්ද, ඒ කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ නිර්දේශද ඇතුළත් කර 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | පනත ප්‍රකාරව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුවේ. | 2016,2017 හා 2018 වාර්තා සියල්ල පිළියෙල කර අමාත්‍ය මණ්ඩල තීරණය ලබා ගැනීමට කටයුතු කරමින් සිටී. | 2016 වර්ෂයේ සිට 2020 දක්වා කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| 5. | කොමිෂන් සභාව දිගු කාර්යයකින් පසු ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක නොවී පැවතුණු අතර කොමිෂන් සභාව විසින් දෙනුලබන නිර්දේශ අනෙකුත් ආයතන සඳහා බලපාන නීතිරීති සමග නොගැළපෙන අවස්ථා හා සමගාමී පරීක්ෂණ පවත්වන ආයතනවල නිර්දේශ සමග ගැටෙන අවස්ථා පැවතුණි. | නිර්දේශ ක්‍රියාත්මක කරවා ගැනීමට කටයුතු කළ යුතු අතර නිර්දේශ, අනෙකුත් ආයතන සඳහා බලපාන නීතිරීති හා සමගාමී පරීක්ෂණ පවත්වන ආයතනවල නිර්දේශ සමග ගැටෙන අවස්ථා මගහරවා ගත යුතුවේ. | ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිරීක්ෂණය එසේම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| 6. | 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල සීමාව තුල ශ්‍රී ලංකා පොලීසිය වෙත ලබාදුන් නිර්දේශ 50 කින් 45 ක්ද, අධ්‍යාපන අමාත්‍යාංශයට අදාලව ලබාදුන් නිර්දේශ 90 කින් 36 ක්ද, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අදාලව ලබාදුන් නිර්දේශ 07 කින් 06 ක්ද ක්‍රියාත්මක වී නොතිබුණි. මෙම නිර්දේශ ලබා දීමට මාස 06 ත් වසර 06 ත් අතර කාලයක් ගතවී තිබුණි. | කෙටි කාලයකින් නිර්දේශ ලබා දීමටත් එම නිර්දේශ ක්‍රියාත්මක කරවා ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | නිර්දේශ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු යාවත්කාලීනව සිදු කර නොතිබුණි. | 2022.01.31 දින වන විට අධ්‍යාපන අමාත්‍යාංශයට අදාලව ක්‍රියාත්මක වී නොතිබුණු නිර්දේශ 36 න් 03 ක් පමණක්ද, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අදාලව ක්‍රියාත්මක වී නොතිබුණු නිර්දේශ 06 න් එක් නිර්දේශයක් පමණක්ද ක්‍රියාත්මක වී තිබුණි. ශ්‍රී ලංකා පොලීසියට අදාලව ක්‍රියාත්මක වී නොතිබුණු නිර්දේශ 45 ම මෙතෙක් ක්‍රියාත්මක වී නොතිබුණි. |
| 7. | කොමිෂන් සභාව විසින් 2017 – 2019 කාලපරිච්ඡේදයට අදාලව පිළියෙල කළ උපාය මාර්ගික සැලැස්මේ පනතේ දුර්වලතා සඳහන් කර ඇතත් එය සංශෝධනය කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | පනත සංශෝධන කිරිමට කටයුතු කළ යුතුවේ. | සංශෝධනය කිරීම පිළිබඳ සාකච්ඡා මට්ටමේ පවතී. | පනත සංශෝධනය කර නැත. |
| 8. | ඉකුත් වර්ෂයේ පැමිණිලි 4,266 ක් ද ඇතුළුව 2020 වර්ෂයේ විසදීම සඳහා | පැමිණිලි විසදීම සඳහා කඩිනම් වැඩපිළිවෙලක් සකස් කළ යුතු වේ. | යාවත්කාලීන කිරීමට පියවර ගනිමින් පවතී. | කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි වලින් 2021.12.31 දිනට |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණු මුළු පැමිණිලි 10,550 න් 3,812 ක් විසඳා සමාලෝචිත වර්ෂය අවසානයට පැමිණිලි 6,738 ක් ඉතිරි වී තිබුණි. මින් පැමැණිලි 23 ක් වසර 10 ටත් පෙර හා පැමිණිලි 1,804 ක් වර්ෂ 03 ත් වර්ෂ 10 ත් අතර කාලයකට පෙර ලැබුණු ඒවා විය. | | | පැමිණිලි 7,699 ක් විසඳීමට පැවති අතර ඉන් පැමිණිලි 30 ක් වසර 10 ට වැඩි කාලයක් තුලද, පැමිණිලි 1860 ක් වර්ෂ 3 ත් වර්ෂ 10 ත් අතර කාලයක් තුලද ලැබුණු ඒවා විය. |
| 9. | 2020 දෙසැම්බර් 31 දිනට තනතුරු 95 ක් පුරප්පාඩුව පැවතුන අතර, අධ්‍යක්ෂකවරු 04 ක්, නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයෙක්, නීති නිලධාරි 12 ක්, මානව හිමිකම් නිලධාරි 23 ක් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරි 02 ක් එයට ඇතුළත් වී තිබුණි. එසේම ස්ථිර පදනමින් නිලධාරීන් බඳවා නොගෙන වැඩ බැලීමේ පදනමට හා රාජකාරි ඉටු කිරීමේ පදනමට නිලධාරීන් 05 දෙනෙකු බඳවාගෙන තිබුණි. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා වන පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | තනතුරු පුරප්පාඩු 24 ක් සම්පූර්ණ කර ඇත. | 2021 දෙසැම්බර් 31 දිනට තනතුරු 69 ක් පුරප්පාඩුව පැවතුණි. අධ්‍යක්ෂකවරු 04 ක්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරු 03 ක් නීති නිලධාරීන් 13 ක්, මානව හිමිකම් නිලධාරීන් 29 ක් එයට ඇතුළත් වී තිබුණි. |

ශීර්ෂ 20 - මැතිවරණ කොමිෂන් සභාව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | 2019 | | | |
| 1. | මැතිවරණ පැමිණිලි විමර්ශනය කිරීමේ පරිගණක පද්ධතිය සකස් කිරීම හා එහි වූ mobile app නිර්මාණය කිරීමේ කාර්යය සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට පිළිවෙලින් රු. 1,952,500 ක් හා රු. 325,000 ක් 2017 වර්ෂයේදී ගෙවා තිබුණි. එම කාර්යයන් 2018 මාර්තු මාසයේදී නිම කළ යුතුව තිබුණද එම කාර්යයන් නිම කර නොතිබුණි. | කාර්යය හැකි ඉක්මණින් නිම කරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාල පද්ධතියේ දෝෂ නිරාකරණය කර දෙන ලෙස රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය දැනුවත් කර ඇත. | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විසින් සකස් කිරීමට නියමිතව තිබූ මැතිවරණ පැමිණිලි විමර්ශනය කිරීමේ පරිගණක පද්ධතිය හා mobile app 2022 ජනවාරි 31 දින වන විටද සකස් කර නොතිබුණි. |
| 2. | යාපනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදාල මූලික අවබෝධතා ගිවිසුම අනුව 2018 දෙසැම්බර් 01 දින වැඩ ආරම්භ කළ යුතු වුවත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණේ එදින සිට මාස 06 කට පසුව වූ අතර අත්තිකාරම් මුදල | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කඩිනමින් වැඩ අවසන් කරන ලෙස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. | මෙම කාර්යය මෙතෙක් නිමවී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ලෙස රු.මිලියන 12.42 ක් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට මාස 3 ½ කට පෙර ගෙවා තිබුණි. | | | |
| 3. | 2019 වර්ෂයේදී කලබඳු කාලය අවසන් වූ වාහන 09 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කල්බදු කාලය අවසන් වූ වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පවරා ගැනීමේ කටයුතු ආරම්භ කර ඇත. | මේ වන විට වාහන 05 ක් පමණක් පවරාගෙන තිබුණි. |
| | 2020 | | | |
| 4. | කොමිෂන් සභාවට අයිති දේපළක් සඳහා මෙට්‍රෝ කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතියෙන් ගෙවා තිබූ රු. 5,200,000 ක විකල්ප නවාතැන් හා තාවකාලික කුලී දීමනා කොමිෂන් සභාවේ සභාපතිවරයා එක් සාමාජිකයෙකු සහ නිලධාරීන් දෙදෙනෙකු විසින් පෞද්ගලිකව ලබා ගෙන තිබුණි. | නිවැරදි කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වීම. | නිවැරදි කිරීම සඳහා ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | මෙතෙක් නිවැරදි කර නැත. |
| 5. | 2016 ජූලි 05 සිට අනුමැතිය ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල තීරණ හා පාර්ලිමේන්තු යෝජනා සම්මුතිය අනුව කොමිෂන් සභා සාමාජිකයින්ට තම පදිංචි ස්ථානයේ සිට | අමාත්‍ය මණ්ඩල තීරණ හා පාර්ලිමේන්තු යෝජනා සම්මුතිය අනුව කටයුතු කළ යුතු වීම. | නිවැරදි කිරීම සඳහා ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | මෙතෙක් නිවැරදි කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කොමිෂන් සභා කාර්යාලයට යාමට ඇති දුර කි.මි. 350 ට වැඩි නම් රු. 50,000 ක ප්‍රවාහන දීමනාවක් හිමි වුවද කොමිෂන් සභාවේ නිල නිවසක් ආර්ථික කුලියක් ගෙවමින් පදිංචිව සිටි කොමිෂන් සභා සාමාජිකයෙකුට වසර 04 ක කාලයක් සඳහා රු. 2,400,000 ක ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. | | | |
| 6. | කොමිෂන් සභාවට අයත් නොවන ඉඩමක රු. 1,771,701 ක වියදමින් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. | කොමිෂන් සභාවට අයත් ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | මෙතෙක් ඉඩම පරවාගෙන නැත. |

ශීර්ෂ 25 - සීමා නිර්ණය කොමිෂන් සභාව

| විගණන නිරීක්ෂණය | | විගණකාධිපතිගේ නිර්දේශය | විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | 2019 | | | |
| 1. | 2019 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් පුනරාවර්තන හා මුලධන වියදම සඳහා රු. 15,875,000 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර වර්ෂයේ මුළු වියදම රු. 12,849,555 ක් විය. ව්‍යවස්ථාදායකය විසින් දැනට නිශ්චිත කාර්යභාරයක් වෙන්කර දී නොමැති බව සඳහන් කර තිබූ බැවින් රු. 12,849,555 ක වියදමේ කාර්යසාධනය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය. | ආයතනය සඳහා නිශ්චිත කාර්යය භාරයක් තිබිය යුතු වේ. | ජනාධිපති ලේකම් සහ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත් සම්පාදක කමිටුව වෙත වරින් වර මේපිළිබඳව දන්වා ඇත. | 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින්ද නිශ්චිත කාර්යභාරයක් පවරාදී නොමැත. |
| | 2020 | | | |
| 2. | කොමිෂන් සභාවේ ජ්‍යෝෂ්ඨ මට්ටමේ තනතුරු දෙක සඳහා 2017 මාර්තු 21 දින සිට වැඩ බලන පදනමින් නිලධාරීන් දෙදෙනෙකු පත්කර තිබුණු අතර වසර ගණනාවක සිට ද්විතීයික මට්ටමේ තනතුරු 05 | අත්‍යවශ්‍ය තනතුරු සඳහා වූ පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නැත. | මේ වන විට එම තත්ත්වය එලෙසම පැවතුණි. |

ක් පුරප්පාඩුව පැවතුණි.

ශීර්ෂ 302 - සමුපකාර සේවක කොමිෂන් සභාව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | 2020 වර්ෂයේ විසර්ජන පනත අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුමේ අවම ලැබීම් සීමාව රු. 700,000 ක් වුවද තත්‍ය ලැබීම රු. 638,490 ක් වූයෙන් සීමාවට ලඟා නොවීම රු. 61,510 ක්ව පැවතියද අවම ලැබීම් සීමාව සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සීමා සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. | අවශ්‍ය අවස්ථාවන්හිදි එම සීමා නිසි පරිදි සංශෝධනය කර ගැනීමට අදාල නිලධාරීන්ට වාචික උපදෙස් ලබා දී ඇත. | අවම ලැබීම් සීමාව සංශෝදනය කරගෙන නොතිබුණි. |
| 2. | 2020 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුල සමුපකාර සමිතිවල සේවකයන් සඳහා දැනුවත්කිරීමේ වැඩමුළු 12 ක් පැවැත්වීමටද, සේවක පැමිණිලි / අභියාචනා 36 ක් විසදීමටද, උපදෙස් ලබාදීම් 50 ක් සිදුකිරීමටද, සැලසුම් කර තිබුණි. එහෙත් දැනුවත් කිරීමේ වැඩමුළු 03 ක් ද, සේවක පැමිණිලි | වර්ෂය තුළ ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් කාර්යයන් ඉටුකර ගැනීමට ක්‍රියාකල යුතුයි. | ගොලීය වසංගත තත්ත්යන් මත රට තුල පැන නගින විවිධ අහිතකර වාතාවරණයන් තුලදී ආයතනයේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට බාධාකාරි තත්ත්වයන් මතුවිය හැකි බැවින්, සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුගතව කාර්තුමය වශයෙන් හඳුනාගත් | 2020 වර්ෂයට අදාල ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | /අභියාචනා විසඳීම් 11 ක්ද, උපදෙස් ලබාදීම් 27 ක්ද පමණක් වර්ෂය තුල සිදුකර තිබුණි. | | කාර්ය සාධන ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | |
| 3. | කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 23 ක් වන අතර තත්‍ය කාර්ය මණ්ඩලය 18 කි. ඒ අනුව තනතුරු පුරප්පාඩු 05 ක් පවතින අතර පරිපාලන නිලධාරී තනතුර 2017 වර්ෂයේ නොවැම්බර් 30 දින සිට කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු අතර එය මේ දක්වා වසරින් වසර දීර්ඝ කරමින් පැවතුණි. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කල යුතුය. | මෙම ආයතනයේ පැවති පුරප්පාඩු ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ පුරප්පාඩු වන බැවින් එම පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වරින් වර ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. පරිපාලන නිලධාරියෙකුගේ සේවය ආයතනයට අත්‍යාවශ්‍ය බැවින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත පමණක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සහ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සිදුකර ඇත. | ආයතනයේ පවතින තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා කරන ලද ඉල්ලීම්වලට මේ වන තුරු සුභවාදී ප්‍රතිචාර ලැබී නැත. කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන සිටි පරිපාලන නිලධාරිනියගේ කොන්ත්‍රාත් කාලය අවසන් වීම මත මේවන විට ඇයගේ සේවය අවසන් කර ඇත. |

ශීර්ෂ 335 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත 3(2)(i) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව අවිච්ඡින්න පැවැත්මක් සහිත සංස්ථාවක් බවට ප්‍රකාශ කර තිබුණ ද වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම හා නිවාඩු හා වියදම් දැරීම, දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම් ආදී විධිවිධාන රජයේ දෙපාර්තමේන්තු ස්වභාවයක් ගෙන තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | භාණ්ඩාගාරය විසින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ගිණුම් කටයුතු සම්බන්ධයෙන් 1991 වර්ෂයේ සිට B ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙසද 2017 නොවැම්බර් 14 දින සිට A ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙසද සළකා කටයුතු කරනු ලැබේ. | මේ සම්බන්ධව ස්ථිර විසඳුමක් මේ දක්වා ලැබී නොමැත. |
| 2. | පනතේ 10 (1)(ඊ) වගන්තිය ප්‍රකාරව දත්ත බැංකුවක් ස්ථාපිත කිරීමට සමාලෝචිත වර්ෂය දක්වා කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම | එකඟ වෙමි. 2020 – 2025 පස් අවුරුදු සැලැස්ම තුළ ඇතුළත් කර ඇත. | 2021 වර්ෂය අවසානය දක්වාම දත්ත බැංකුවක් ස්ථාපිත කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 3. | ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභා නිර්දේශ ඇතුළත් වාර්තාවක් වාර්ෂිකව ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම | පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව වාර්තාවක් අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීමට මෙතෙක් කටයුතු කර නොමැති අතර, ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය පියවර ගනිමි. | කොමිෂන් සභා නිර්දේශ ඇතුළත් වාර්ෂික වාර්තාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට 2021 දෙසැම්බර් දක්වා කටයුතු කර නොතිබුණි. |
| 4. | කොමිෂන් සභාව විසින් 1992 වර්ෂයේ ඉදිරිපත් කළ අධ්‍යාපන ප්‍රතිපත්තිය සඳහා වූ යෝජනාවලිය පදනම් කරගෙන 1997 වර්ෂයේ ජනාධිපතිවරයා විසින් අධ්‍යාපන ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත්කර තිබුණ ද ඉන් පසුව ඉදිරිපත් කරන ලද අධ්‍යාපන ප්‍රතිපත්ති සඳහා වූ යෝජනාවලින් ප්‍රතිපත්ති ලෙස ප්‍රකාශයට පත්කර නොතිබුණි. | කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාවලින් පදනම් කර ගෙන අධ්‍යාපන ප්‍රතිපත්ති සඳහා යෝජනාවලින් ප්‍රතිපත්ති ලෙස ප්‍රකාශයට පත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | මෙම කොමිෂන් සභාවේ කාර්යය වනුයේ ප්‍රතිපත්ති යෝජනා සකස් කර ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම පමණක් වන අතර එය ප්‍රතිපත්තියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සිදු කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසින් වේ. | වර්තමානයට ගැලපෙන පරිදි අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රකාශයට පත්කර නොතිබුණි. |

ඇමුණුම -1

| ශීර්ෂය | වර්ෂය | මුල් ප්‍රතිපාදනය | | | ශුද්ධ ප්‍රතිපාදනය | | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම |
| 6 | 2018 | 175,065,000 | 58,221,000 | 233,286,000 | 188,000,000 | 143,481,000 | 331,481,000 |
| | 2019 | 223,230,000 | 38,600,000 | 261,830,000 | 222,841,000 | 38,989,000 | 261,830,000 |
| | 2020 | 232,020,000 | 11,700,000 | 243,720,000 | 232,020,000 | 11,700,000 | 243,720,000 |

| ශීර්ෂය | වර්ෂය | සත්‍ය වියදම | | | ඉතිරිය | | | විගණන මතය |
|---|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | |
| 6 | 2018 | 183,967,541 | 115,047,379 | 299,014,920 | 4,032,459 | 28,433,621 | 32,466,080 | තත්ත්වාගණනය කළ මතය |
| | 2019 | 215,524,767 | 34,928,713 | 250,453,480 | 7,316,233 | 4,060,287 | 11,376,520 | තත්ත්වාගණනය කළ මතය |
| | 2020 | 220,553,549 | 10,244,656 | 230,798,205 | 11,466,451 | 1,455,344 | 12,921,795 | තත්ත්වාගණනය කළ මතය |

| ශීර්ෂය | වර්ෂය | මුල් ප්‍රතිපාදනය | | | ශුද්ධ ප්‍රතිපාදනය | | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම |
| 7 | 2018 | 71,683,000 | 1,800,000 | 73,483,000 | 74,509,000 | 2,400,000 | 76,909,000 |
| | 2019 | 76,580,000 | 9,600,000 | 86,180,000 | 91,395,800 | 9,600,000 | 100,995,800 |
| | 2020 | 106,610,000 | 5,450,000 | 112,060,000 | 106,610,000 | 5,450,000 | 112,060,000 |

| ශීර්ෂය | වර්ෂය | සත්‍ය වියදම | | | ඉතිරිය | | | විගණන මතය |
|---|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | |
| 7 | 2018 | 68,144,690 | 2,301,653 | 70,446,343 | 6,364,310 | 98,347 | 6,462,657 | තත්ත්වාගණනය කළ මතය |
| | 2019 | 83,302,928 | 3,187,258 | 86,490,186 | 8,092,872 | 6,412,742 | 14,505,614 | තත්ත්වාගණනය කළ මතය |
| | 2020 | 94,417,966 | 275,250 | 94,693,216 | 12,192,034 | 5,174,750 | 17,366,784 | තත්ත්වාගණනය නොකළ මතය |

| ශීර්ෂය | වර්ෂය | මුල් ප්‍රතිපාදනය | | | ශුද්ධ ප්‍රතිපාදනය | | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම |
| 8 | 2018 | 94,930,000 | 2,950,000 | 97,880,000 | 117,315,000 | 10,449,000 | 127,764,000 |
| | 2019 | 128,770,000 | 3,700,000 | 132,470,000 | 155,561,000 | 6,905,000 | 162,466,000 |
| | 2020 | 171,790,000 | 5,160,000 | 176,950,000 | 171,790,000 | 5,160,000 | 176,950,000 |

| ශීර්ෂය | වර්ෂය | සත්‍ය වියදම | | | ඉතිරිය | | | විගණන මතය |
|---|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | |
| 8 | 2018 | 115,444,941 | 6,480,335 | 121,925,276 | 1,870,059 | 3,968,665 | 5,838,724 | තත්ත්වාග ණනය නොකළ මතය |
| | 2019 | 148,453,554 | 6,175,574 | 154,629,128 | 7,107,446 | 729,426 | 7,836,872 | තත්ත්වාග ණනය නොකළ මතය |
| | 2020 | 164,825,052 | 4,227,305 | 169,052,357 | 6,964,948 | 932,695 | 7,897,643 | තත්ත්වාග ණනය කළ මතය |

| ශීර්ෂය | වර්ෂය | මුල් ප්‍රතිපාදනය | | | ශුද්ධ ප්‍රතිපාදනය | | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම |
| 9 | 2018 | 24,840,000 | 650,000 | 25,490,000 | 26,816,000 | 650,000 | 27,466,000 |
| | 2019 | 27,900,000 | 1,075,000 | 28,975,000 | 28,245,000 | 1,075,000 | 29,320,000 |
| | 2020 | 30,605,000 | 150,000 | 30,755,000 | 30,605,000 | 150,000 | 30,755,000 |

| ශීර්ෂය | වර්ෂය | සත්‍ය වියදම | | | ඉතිරිය | | | විගණන මතය |
|---|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | |
| 9 | 2018 | 26,268,933 | 486,875 | 26,755,808 | 547,067 | 163,125 | 710,192 | තත්ත්වාග ණනය නොකළ මතය |
| | 2019 | 27,946,155 | 639,966 | 28,586,121 | 298,845 | 435,034 | 733,879 | තත්ත්වාග ණනය කළ මතය |
| | 2020 | 28,546,396 | 43,072 | 28,589,468 | 2,058,604 | 106,928 | 2,165,532 | තත්ත්වාග ණනය කළ මතය |

| ශීර්ෂය | වර්ෂය | මුල් ප්‍රතිපාදනය | | | ශුද්ධ ප්‍රතිපාදනය | | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම |
| 10 | 2018 | 441,100,000 | 29,000,000 | 470,100,000 | 452,713,000 | 58,139,000 | 510,852,000 |
| | 2019 | 432,300,000 | 86,000,000 | 518,300,000 | 461,440,000 | 186,000,000 | 647,440,000 |
| | 2020 | 509,576,000 | 30,050,000 | 539,626,000 | 509,576,000 | 30,050,000 | 539,626,000 |

| ශීර්ෂය | වර්ෂය | සත්‍ය වියදම | | | ඉතිරිය | | | විගණන මතය |
|---|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | |
| 10 | 2018 | 395,455,878 | 33,923,222 | 429,379,100 | 57,257,122 | 24,215,778 | 81,472,900 | තත්ත්වාගණනය නොකළ මතය |
| | 2019 | 453,434,452 | 40,188,738 | 493,623,190 | 8,005,548 | 145,811,262 | 153,816,810 | තත්ත්වාගණනය කළ මතය |
| | 2020 | 464,146,755 | 23,318,665 | 487,465,420 | 45,429,244 | 6,731,335 | 52,160,579 | තත්ත්වාගණනය කළ මතය |

| ශීර්ෂය | වර්ෂය | මුල් ප්‍රතිපාදනය | | | ශුද්ධ ප්‍රතිපාදනය | | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම |
| 11 | 2018 | 68,600,000 | 199,800,000 | 268,400,000 | 58,350,000 | 310,950,000 | 369,300,000 |
| | 2019 | 74,910,000 | 119,390,000 | 194,300,000 | 74,910,000 | 119,390,000 | 194,300,000 |
| | 2020 | 79,140,000 | 18,250,000 | 97,390,000 | 79,140,000 | 18,250,000 | 97,390,000 |

| ශීර්ෂය | වර්ෂය | සත්‍ය වියදම | | | ඉතිරිය | | | විගණන මතය |
|---|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | |
| 11 | 2018 | 55,984,302 | 217,495,407 | 273,479,709 | 2,365,698 | 93,454,593 | 95,820,291 | තත්ත්වාගණනය නොකළ මතය |
| | 2019 | 70,609,064 | 113,199,548 | 183,808,612 | 4,300,936 | 6,190,452 | 10,491,388 | තත්ත්වාගණනය නොකළ මතය |
| | 2020 | 70,963,603 | 16,008,223 | 86,971,826 | 8,176,397 | 2,241,777 | 10,418,174 | තත්ත්වාගණනය නොකළ මතය |

| ශීර්ෂය | වර්ෂය | මුල් ප්‍රතිපාදනය | | | ශුද්ධ ප්‍රතිපාදනය | | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම |
| 13 | 2018 | 244,000,000 | 5,100,000 | 249,100,000 | 244,000,000 | 26,165,000 | 270,165,000 |
| | 2019 | 213,400,000 | 14,400,000 | 227,800,000 | 222,064,000 | 21,585,000 | 243,649,000 |
| | 2020 | 216,120,000 | 6,600,000 | 222,720,000 | 215,770,000 | 6,950,000 | 222,720,000 |

| ශීර්ෂය | වර්ෂය | සත්‍ය වියදම | | | ඉතිරිය | | | විගණන මතය |
|---|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | |
| 13 | 2018 | 204,481,866 | 22,363,913 | 226,845,779 | 39,518,134 | 3,801,087 | 43,319,221 | තත්ත්වාගණනය නොකළ මතය |
| | 2019 | 206,890,955 | 14,083,405 | 220,974,360 | 15,173,045 | 7,501,595 | 22,674,640 | තත්ත්වාගණනය කළ මතය |
| | 2020 | 205,589,510 | 3,806,328 | 209,395,838 | 10,180,489 | 3,143,673 | 13,324,162 | තත්ත්වාගණනය කළ මතය |

| ශීර්ෂය | වර්ෂය | මුල් ප්‍රතිපාදනය | | | ශුද්ධ ප්‍රතිපාදනය | | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම |
| 20 | 2018 | 6,206,450,000 | 114,250,000 | 6,320,700,000 | 6,205,605,000 | 115,550,000 | 6,321,155,000 |
| | 2019 | 4,721,580,000 | 122,350,000 | 4,843,930,000 | 4,725,960,000 | 134,470,000 | 4,860,430,000 |
| | 2020 | 10,202,930,000 | 64,000,000 | 10,266,930,000 | 10,187,035,000 | 80,100,000 | 10,267,135,000 |

| ශීර්ෂය | වර්ෂය | සත්‍ය වියදම | | | ඉතිරිය | | | විගණන මතය |
|---|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | |
| 20 | 2018 | 4,052,690,214 | 52,569,809 | 4,105,260,023 | 2,152,914,786 | 62,980,191 | 2,215,894,977 | තත්ත්වාගණනය නොකළ මතය |
| | 2019 | 3,984,049,501 | 124,207,271 | 4,108,256,772 | 741,910,499 | 10,262,729 | 752,173,228 | තත්වාගණනය කළ මතය |
| | 2020 | 7,804,435,568 | 71,283,094 | 7,875,718,662 | 2,382,599,432 | 8,816,906 | 2,391,416,338 | තත්ත්වාගණනය කළ මතය |

| ශීර්ෂය | වර්ෂය | මුල් ප්‍රතිපාදනය | | | ශුද්ධ ප්‍රතිපාදනය | | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම |
| 25 | 2018 | 10,810,000 | 725,000 | 11,535,000 | 14,015,000 | 725,000 | 14,740,000 |
| | 2019 | 15,055,000 | 820,000 | 15,875,000 | 15,055,000 | 820,000 | 15,875,000 |
| | 2020 | 13,230,000 | 80,000 | 13,310,000 | 13,230,000 | 80,000 | 13,310,000 |

| ශීර්ෂය | වර්ෂය | සත්‍ය වියදම | | | ඉතිරිය | | | විගණන මතය |
|---|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | |
| 25 | 2018 | 12,786,303 | 570,128 | 13,356,431 | 1,228,697 | 154,872 | 1,383,569 | තත්ත්වාගණනය නොකළ මතය |
| | 2019 | 12,409,285 | 440,270 | 12,849,555 | 2,645,715 | 379,730 | 3,025,445 | තත්ත්වාගණනය නොකළ මතය |
| | 2020 | 12,085,167 | | 12,085,167 | 1,144,833 | 80,000 | 1,224,833 | තත්ත්වාගණනය කළ මතය |

| ශීර්ෂය | වර්ෂය | මුල් ප්‍රතිපාදනය | | | ශුද්ධ ප්‍රතිපාදනය | | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම |
| 302 | 2018 | 16,230,000 | 1,700,000 | 17,930,000 | 16,230,000 | 1,700,000 | 17,930,000 |
| | 2019 | 17,000,000 | 2,000,000 | 19,000,000 | 17,848,000 | 2,000,000 | 19,848,000 |
| | 2020 | 18,370,000 | 630,000 | 19,000,000 | 18,370,000 | 630,000 | 19,000,000 |

| ශීර්ෂය | වර්ෂය | සත්‍ය වියදම | | | ඉතිරිය | | | විගණන මතය |
|---|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | |
| 302 | 2018 | 15,708,791 | 1,488,430 | 17,197,221 | 521,209 | 211,570 | 732,779 | තත්ත්වාගණනය නොකළ මතය |
| | 2019 | 17,073,244 | 1,110,643 | 18,183,887 | 774,756 | 889,357 | 1,664,113 | තත්ත්වාගණනය නොකළ මතය |
| | 2020 | 16,180,913 | 127,652 | 16,308,565 | 2,189,087 | 502,348 | 2,691,435 | තත්ත්වාගණනය නොකළ මතය |

| ශීර්ෂය | වර්ෂය | මුල් ප්‍රතිපාදනය | | | ශුද්ධ ප්‍රතිපාදනය | | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම |
| 335 | 2018 | 40,202,000 | 9,250,000 | 49,452,000 | 40,010,000 | 9,470,000 | 49,480,000 |
| | 2019 | 41,370,000 | 9,350,000 | 50,720,000 | 42,733,000 | 9,350,000 | 52,083,000 |
| | 2020 | 40,340,000 | 2,145,000 | 42,485,000 | 40,340,000 | 2,145,000 | 42,485,000 |

| ශීර්ෂය | වර්ෂය | සත්‍ය වියදම | | | ඉතිරිය | | | විගණන මතය |
|---|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | |
| 335 | 2018 | 38,473,541 | 7,990,910 | 46,464,451 | 1,536,459 | 1,479,090 | 3,015,549 | තත්ත්වාගණනය කළ මතය |
| | 2019 | 39,806,234 | 4,553,885 | 44,360,119 | 2,926,766 | 4,796,115 | 7,722,881 | තත්ත්වාගණනය කළ මතය |
| | 2020 | 38,115,215 | 1,119,582 | 39,234,797 | 2,224,785 | 1,025,418 | 3,250,203 | තත්ත්වාගණනය කළ මතය |